# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පලකරනු ලබන නිවේදනයයි

**2020 අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිපල අනුව 2020/2021 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන්ට කෙරෙන නිවේදනයයි**

2011 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා නව සහ පැරණි විෂය නිර්දේශයන් යටතේ පෙනී සිටි සිසුන්ට අදාළව SC(FR) 29/2012 නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් නියෝගය අනුව යමින්, 2020 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා නව නිර්දේශය සහ පැරණි නිර්දේශය යටතේ පෙනී සිටින සිසුන්ද වෙනම කාණ්ඩ දෙකක්*(two distinct populations)* වශයෙන් සැලකීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිනු ලැබේ. ඒ අනුව, 2020 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සිසුන් විසින් ලබා ගන්නා Z-අගය පදනම් කරගෙන 2020/2021 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගැනීමට භාවිත කල යුතු උපමාන මොනවාද යන්න යෝජනා කිරීම සඳහා නිපුණතා කමිටුවක්*(Committee of Experts)*විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලදි.

එම නිපුණතා කමිටුවෙහි නිර්දේශ පදනම් කර ගෙන, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ (වරින් වර සංශෝධිත)15 (vii) වගන්තියට අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශ කමිටුවේ නිර්දේශ පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පහත සඳහන් තීරණවලට එළඹුණි.

- 2020 වර්ෂයේ අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා <u>නව නිර්දේශය</u> යටතේ පෙනී සිටින සිසුන් විශ්වවිද්‍යාලවල එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන ප්‍රතිශතය, 2014 වසරේ සිට 2018 වසර දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දී <u>පළමු සහ දෙවන වරට</u> අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි, පිළිවෙළින් දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ සංයුත මධ්‍යකයේ*(Composite Average)* ප්‍රතිශතය වේ.

- 2020 වර්ෂයේ අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා <u>පැරණි නිර්දේශය</u> යටතේ පෙනී සිටින සිසුන් විශ්වවිද්‍යාලවල එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන ප්‍රතිශතය, 2014 වසරේ සිට 2018 වසර දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දී <u>තුන්වන වරට</u> අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි, පිළිවෙළින් දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ සංයුත මධ්‍යකයේ*(Composite Average)* ප්‍රතිශතය වේ.

ඒ අනුව, 2020 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සිසුන් විසින් ලබා ගන්නා Z-අගය පදනම් කරගෙන 2020/2021 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීම ඉහතින් සඳහන් කරන ලද තීරණවලට අනුව සහ 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා නිකුත් කිරීමට නියමිත "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය" යන අත්පොතෙහි ඇතුළත් නීතිරීතිවලට යටත්ව සිදු කෙරෙනු ඇත.

සභාපති<br>
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව<br>
අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07<br>
2020.10.07